ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව
පුත්තලම දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 16 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 24 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පූර්ව වර්ෂයේ මිලදී ගන්නා ලද රු.110,800ක රෙදි ආවරණ සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණද කර්මාන්ත ගබඩා තොගයෙන් ඉවත් නොකිරීමෙන් රු.110,800කින් කර්මාන්ත ගබඩා තොගය සහ සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කර ගැනීමට පියවර ගනිමි. |
| (ii) | ඉකුත් වර්ෂවලට අදාළව අයකර තැන්පත් ලෙස සටහන් කර තිබූ ඉඩම් කට්ටි කිරීමේ බදු රු.417,868ක් සහ මෝටර් ග්‍රේඩරය කුලියට දීමේ ආදායම් රු.74,000ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාළ වර්ෂයට ගැලපීම් සිදු කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කර ගැනීමට පියවර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | තැන්පත් ගිණුම සහ තැන්පත් ලේඛනය අතර වෙනස සඳහා ජර්නල් සටහන් අංක 46 මගින් තැන්පත් ගිණුම රු.453,763ක් හර කර සමුච්චිත අරමුදල රු.453,763ක් බැර කර තිබුණි. | තැන්පත් ගිණුම සහ ලේඛනය අතර වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉඩම් කට්ටි කිරීමේ බදු හා මෝටර් ග්‍රේඩර් ආදායම් රු.491,868ක් තැන්පත් ගිණුමේ ශේෂයෙන් ඉවත් නොවීම ජර්නල් සටහන් අංක 46හි පවතින වෙනසට හේතු වන අතර එම වෙනස ගැලපූ පසුවද තවත් රු.38,105ක වෙනසක් ගිණුම හා ලේඛනය අතර පවතී. එය ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී සොයා නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (iv) | පූර්ව වර්ෂවලට අදාළව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් රු.420,000ක් ජර්නල් සටහන් අංක 02 මගින් විශ්‍රාම වැටුප් ගිණුමට හර කර තිබුණි. | වර්ෂයට අදාළ වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කර ගැනීමට පියවර ගනිමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතුව රු.59,883,574ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවූ ශේෂය රු.21,148,839ක් විය . | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට පියවර ගනිමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය ගිණුම් ශේෂ 02ක එකතුව රු.27, 802,817ක් වූ අතර, ඒ අතරින් වසර 01 ඉක්මවූ ශේෂය රු.1, 884,415ක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතු වේ. | රු.1,554,408ක් 2020 වර්ෂයේ ගෙවා ඇති අතර, ඉතිරි මුදල් ගෙවීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අංක 126 (XXVII) උපවගන්තිය | ධීවර කාර්මිකයින් සඳහා සුභසාධන පහසුකම් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පනවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 චක්‍රලේඛය | සභාව විසින් සපයනු ලබන සියළුම සේවාවන් සඳහා පුරවැසි ප්‍රඥප්තියක් සකස් කළ යුතු වුවද මහජන සේවා 09ක් සඳහා පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර නොතිබුණි. | සභාව විසින් සපයන සේවා සඳහා පුරවැසි ප්‍රඥප්තියක් සකස් කළ යුතු වේ. | පුරවැසි ප්‍රඥප්තිය යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 1.6 ඡේදය | ස්ථාන මාරුවී ගොස් සිටින නිලධාරීන්/ සේවකයින් 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු.129,310ක් වූ ණය මුදල් වසර 11ක කාලයක් තුල නිරවුල් වී නොතිබුණි. | අය විය යුතු සේවක ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පසුගිය වර්ෂයන්ට අදාල හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ සේවකයින් වෙත ලිපි මගින් දැනුවත් කර ඇති අතර එම ණය ගෙවීමට කටයුතු සිදු නොකළහොත් ඇපකරුවන්ගෙන් එම ණය වාරික කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,817,939ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,090,303ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019වර්ෂය | | | | 2018වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්ත මේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 7,376 | 7,774 | 7,595 | 12,124 | 7,059 | 7,085 | 6,834 | 10,945 |
| කුලී | 5,772 | 7,990 | 7,990 | 2,098 | 4,856 | 7,609 | 9,838 | 2,492 |
| බලපත්‍ර ගාස්තු | 1,083 | 1,561 | 1,561 | - | 1,135 | 1,185 | 1,209 | - |
| වෙනත් ආදායම් | 50,628 | 50,628 | 57,088 | 42,499 | 49,048 | 49,048 | 26,329 | 54,226 |
| එකතුව | 64,859 | 67,953 | 74,234 | 56,721 | 62,098 | 64,927 | 44,210 | 67,663 |

ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කස ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුළු බිල්කළ ආදායම රු.67,953,787ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ ආදායම රු.68,215,721ක් වූ අතර, | වාර්ෂිකව බිල්කළ ආදායම් වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් ඉදිරියේ අය කිරීමට කටයුතු කරමි. |

සමාලෝචිත වර්ෂය තුලදී බිල්කළ ආදායමෙන් හා හිඟ ආදායමෙන් රු.74,234,860ක් රැස්කර තිබුණි. ඒ අනුව වර්ෂය තුල සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 55ක් පමණ විය.

### 2.2.3 වරිපනම් හා බදු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් හා බදු හිඟය රු.11,501,179ක් වූ අතර සභාව විසින් වරිපනම් බදු එකතු කිරීමේ වගකීම නිසි ලෙස ඉටුකර නොතිබුණි. | සියළුම හිඟ වරිපනම් හා බදු කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ හිඟ මුදලින් රු.622,904ක් අය කරගෙන ඇත. |

### 2.2.4 කුලී

----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ බදු කුලී රු.1,880,387ක් සහ කඩ කුලී රු.102,460ක් අයකරගෙන නොතිබුණි. | සියළුම හිඟ කඩ කුලී සහ බදු කුලී කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කඩකුලීවලින් රු.80,639ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. බදු කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එම හිඟ මුදලින්ද රු.34,953ක් අයකර ගෙන ඇත. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.4,070,684ක් වූ උසාවි දඩ සහ රු.23,562,590ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | සියළුම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගතයුතු උසාවි දඩ ආදායමෙන් රු.3,422,500ක මුදලක් මේ වනවිටත් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල්ද කඩිනමින් අයකර ගැනීමට පියවර ගනිමි. 2008 සිට 2013 දක්වා හිඟ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කර ඇත. 2018 සහ 2019 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.13,955,380කින් රු.1,614,080ක් 2020 ජුනි 02 දින ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

------------------

| | <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|---|
| (i) | මහජන සෞඛ්‍ය සහ සුඛ විහරණ ක්‍රම අනුව සෞඛ්‍යයට අහිතකර කෑමට හෝ බීමට ගන්නා දේවල් තහනමට ගැනීම, ඉවත් කිරීම හා ඒවා විකිණීම සඳහා තැබීම වැළැක්වීම සහ බේකරි, භෝජන ශාලා, හෝටල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම යන කටයුතු පාලනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කරනු ලැබේ. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සාමාජීය වටිනාකමින් යුත් කුරුළු අභය භූමිය රැක ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | කඩිනමින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | අදාළ අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පනවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ඉකුත් වර්ෂයේ සිට කොම්පෝස්ට් ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද කසළ බැහැර කිරීම සඳහා සුදුසු පරිසරයකින් යුත් ඉඩමක් ලබා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව විසින් සභා බල ප්‍රදේශය තුළ දෛනිකව රැස්කරන කසළ අවසන් බැහැරලීම සඳහා අක්කර 05ක භූමි ප්‍රදේශයක් ඉල්ලා විවිධ අවස්ථාවලදී විවිධ ආයතන සඳහා ඉල්ලීම් කළ නමුත් ඒ සම්බන්ධ කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බව මෙයින් දන්වා සිටිමි. |
| (ii) සභාව විසින් රැස් කරන කසළ වර්ගීකරණයකින් තොරව බැහැර කිරීම සිදු කරන අතර නොදිරන ද්‍රව්‍ය මගින් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳව සැළකිල්ලට ගෙන නොතිබුණි. | කසළ වර්ගීකරණය කර අදාළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ යුතු වේ. | අප සභාව විසින් සකස් කර ඇති කොම්පෝස්ට් අංගනය ඉදිකිරිම සඳහා ව්‍යාපෘති වාර්තාව ඉඩම් පරිහරණ කමිටුවට ඉදිරිපත් කර වෛරන්කට්ටුව රජයේ ඉඩමෙන් අක්කර 05ක භූමි භාගයක් ලබා ගැනීමට උත්සහ දරන බව දන්වා සිටිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂිකව වැඩිවෙමින් පවතින හිඟ ආදායම් වන ජල බදු, මුද්දර ගාස්තු හා දීර්ඝ කාලයක සිට අයවීමකින් තොරව පවතින වරිපනම් බදු, අක්කර බදු හා කඩ කාමර කුලී ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අදාළ නීතිමය පියවර ගත යුතු වේ. | වරිපනම් හිඟයෙන් 2019 වර්ෂයේ වරිපනම් හිඟ රැස් කිරීම් රු.2,683,508ක් වන අතර හිඟ මුදල් අයකර ගැනීම සඳහා වැඩසටහන්ද ක්‍රියාත්මක කර ඇත. හිඟ කඩකුලීවලින් රු.80,639ක් අයකර ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. බදු කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එම මුදලින්ද රු.34,953ක් අයකර ඇත. ඉතිරි මුදල්ද කඩිනමින් අයකර ගැනීමට පියවර ගනිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ද්විතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 10ක්ද ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 07ක්ද පැවති අතර කොන්ත්‍රාත්/ආදේශක තනතුරු සඳහා 09 දෙනෙකු අනුමත කාර්යය මණ්ඩලයෙන් බැහැරව සේවයේ යොදවා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් දීර්ඝ කාලීනව පවතින අතිරික්ත සේවක ප්‍රමාණය විධිමත් පරිදි අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | 2019.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 85 වන අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 77 කි. පුරප්පාඩු 17ක් වන අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව 09ක් ලෙස දක්වා ඇත්තේ ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත සභාව මගින් වැටුප් ගෙවනු ලබන සේවක සංඛ්‍යාව වේ. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අභ්‍යන්තර විගණනය**

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකර විධිමත් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකර විධිමත් වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | අභ්‍යන්තර විගණන ඒකකය හඳුන්වා දී ඇති අතර එමගින් විගණන පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. |